# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2019 පෙබරවාරි මස 22 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2019.02.25 දින නිකුත් කරන ලදී)**


## සමාගම් (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තාරක බාලසූරිය මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

සමාගම් (සංශෝධන)

## 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

ශ්‍රී ලංකා ව්‍යවස්ථාව තුළ කාන්තාවන්හට තමන්ගේ විභවතාවයන් සපුරා ගැනීමට සහ තමන්ගේ ස්වීය අනන්‍ය භූමිකාවන් හා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගන්නා සාධාරණ තරඟ බිමක තරඟ කිරීම සඳහා සම අයිතිවාසිකම් ආරක්ෂා කර ඇති හෙයින් ද:

ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය අවම මට්ටමක පවතින අතර, විශේෂයෙන්ම සමාගම් ක්ෂේත්‍රය තුළ එය තවදුරටත් අඩුවෙමින් පවතින නිසා ආර්ථිකයට විශාල වශයෙන් ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකිවන පරිදි සමාගම් ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල තුළට කාන්තාවන් ඇතුළත් කිරීම සඳහා බලය ලබා දෙන නීති සම්පාදනය අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2019 අංක      දරන සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 201අ වගන්තිය ඇතුළත් කිරීම.

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 201 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය 201අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

> "201අ. කිසියම් සමාගමක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තිදෙනකු හෝ ඊට වැඩි නම්, තුනෙන් එකක කාන්තා නියෝජනයක් පවත්වාගෙන යාම ප්‍රායෝගිකව හැකි අවස්ථාවක දී එම සංඛ්‍යාවෙන් තුනෙන් එකක කාන්තා නියෝජනයක් පවත්වාගෙන යා යුතු යි.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.